**LING E 1015**

**වාග්විද්‍යා ප්‍රවේශය**

**අනිවාර්ය පාඨමාලාව**

**01.අභිමතාර්ථ :** විසිවන සියවසේ වාග්විද්‍යාවේ විෂය ක්ෂේත්‍රය, සංකල්ප හා සාපේක්ෂ වැදගත්කම පිළිබඳ මූලික දැනුමක් ලබා ගැනීම.

- ව්‍යාකරණයේ ආකෘතිකමය විශ්ලේෂණය පිළිබඳ මූලික කුසලතා ලබා ගැනීම.
  උදා-: භාෂාවේ පදිම හා වාක්‍ය විචාරාත්මක අංශය බඳු
- භාෂාව පිළිබඳ අපක්ෂපාතී ආකල්ප වර්ධනය කර ගැනීම සහ එමගින් වාග්විද්‍යාවේ අනුකරණයන් හා ප්‍රාග් විනිශ්චයන් දුරු කර ගැනීම.

**02. ඉගෙනුම් ඵල :**

පාඨමාලාව අවසානයේ විද්‍යාර්ථියාට,

- භාෂාව ක්‍රමානුකූලව හා විධිමත්ව නිර්වචනය කිරීමට
- වාග්විද්‍යාත්මක සංකේත පද්ධතියක් ලෙස භාෂාව විස්තර කිරීමට
- භාෂා පද්ධතිය තුළ ඇති අනු පද්ධති හඳුනා ගැනීමට
- භාෂාවේ විධිමත් විශ්ලේෂණය පදනම් කරගෙන ව්‍යාකරණයේ විවිධ රූප හඳුනා ගැනීමට
- පහත සඳහන් දෘෂ්ටිකෝණයන්ගේ විෂය ක්ෂේත්‍රය හා මූලික සංකල්ප විස්තර කිරීමටඃ සමාජ වාග්විද්‍යාව, මනෝවාග්විද්‍යාව හා ව්‍යවහාරික වාග්විද්‍යාව
- භාෂාවේ තිරස් හා සිරස් විශ්ලේෂණය වෙන් කර හඳුනා ගැනීමට
- භාෂණයේ ස්වභාවය හා ලේඛනය හා භාෂණය අතර ඇති සම්බන්ධතාව පැහැදිලි කිරීමට
- භාෂක සමාජයක් තුළ පවත්නා භාෂා ප්‍රභේද හා ඒවායේ වෙනස් ක්‍රියාකාරීත්වය හඳුනා ගැනීමට
- සමාජමය හා මනෝවිද්‍යාත්මක සංසිද්ධියක් ලෙස භාෂාව පිළිබඳ අවබෝධය ලබා ගැනීමටත් හැකියාව ලැබෙනු ඇත.

**03. අන්තර්ගතය :**

- භාෂාව පිළිබඳ නිර්වචනය
- භාෂාවේ කාර්යය
- භාෂණය හා ලේඛනය
- භාෂාවේ අනු පද්ධති
- භාෂාවේ ව්‍යාකරණාත්මක සංස්ථිතියඃ පදිම විචාරාත්මක හා වාක්‍ය විචාරාත්මක දෘෂ්ටි කෝණයෙන් විමසීම

- වාග්විද්‍යාත්මක දෘෂ්ටිකෝණ: සමාජවාග්විද්‍යාව, මනෝවාග්විද්‍යාව හා ව්‍යවහාරික
  වාග්විද්‍යාව.
- වාග්විද්‍යාත්මක සංකල්ප :භාෂාත්මක පද්ධති, තිරස් හා සිරස් විශ්ලේෂණය, ලොං හා පරොල් භාෂාව,ශක්‍යතාව හා නිර්වහනය,භාෂා ප්‍රභේදපදිම විචාරය, වාක්‍ය විචාරය(අනන්තර සංයෝජක විශ්ලේෂණය, පාද සංස්ථිකරණය)

**4. ඇගයීම් :**

වර්ෂ අවසාන පරීක්ෂණය : පැය තුනක (03) ප්‍රශ්න පත්‍රය.

**5. නිර්දේශිත කියවීම්:**


Chomsky, N. (1986). *Knowledge of language; its nature, origin and use.* New York: Praeger.

Crystal, D. (1971). *Linguistics*. Penguin, Harmondsworth.

Hockett, C.F. (1958). *A course in linguistics*. (P. 123-137, 166-182, 209-213, 240-245, 271-283.). New Delhi: Oxford& IBH publishing Co.

O' Grady,William, M Dobrovolsky. (1989). *contemporary linguistics: (*ch. 4). New York: An introduction

Robins, R. H. (1964). *General linguistics: An Introduction Survey.*4th edition, p. 184-202,227-246: Longman, London.

අබේසිංහ, ඒ.ඒ. (1990), *සිංහල වාක්‍ය විභාගය: සරල වාක්‍ය,* කර්තෘ ප්‍රකාශනයකි.

අබේසිංහ, ඒ. ඒ. (1992). *සිංහල භාෂාවේ සංකීර්ණ වාක්‍ය විභාගය,* කර්තෘ ප්‍රකාශනයකි.

කරුණාතිලක, ඩබ්. එස්. රත්න විජේතුංග, ආර්. එම්. ඩබ්. රාජපක්ෂ. (1996). *වාග්විද්‍යා ප්‍රවේශය.* (පි 85-138.) කැලණිය: දර්ශක ප්‍රකාශන.

කහඳගමගේ, පියසේන. (1998). *ප්‍රදේශිය ව්‍යවහාර*, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ,

දිසානායක, ජේ. බී. (2000). *බසක මහිම 1-12 දක්වා.*කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ,

දිසානායක, ජේ. බී. (2005). *මානව භාෂා ප්‍රවේශය*, සුමිත ප්‍රකාශකයෝ.

දිසානායක, ජේ. බී. (1995). *සමකාලීන සිංහල ලේඛන ව්‍යවහාරය: ව්‍යාකරණ ප්‍රවේශය,*කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ,

ධර්මදාස, කේ. එන්. ඕ. (1996). *භාෂාව හා සමාජය (වාග් විද්‍යාත්මක ගවේෂණයක්),* කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ,

ජයසේකර, චිත්‍රා, රාජපක්‍ෂ, ආර්. එම්. ඩබ්ලිව්. දැල බණ්ඩාර, ගාමිණී, (1996), *වාග්විද්‍යාත්මක ලිපි*, (ආනන්ද ජයසේකර), කැලණියඃ සම්භාව්‍ය ප්‍රකාශන,

බලගල්ලේ, විමල්. (1995). *භාෂා අධ්‍යයන හා සිංහල ව්‍යවහාරය.* (පි168-177). කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ,

සිල්වා, සුගතපාල ද. (1972). *භාෂා විෂයක ලිපි* (පි 10-14, 19-28). කොළඹඃ සීමාසහිත ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට් සමාගම.